සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

1157

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ............................................ විභාග අංකය :- ............................

## I කොටස

සැලකිය යුතුයි:
* ප්‍රශ්නවලට සියල්ලටම පිළිතුරු සපයන්න.
* දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා එම පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) සහම්පති මහා බ්‍රහ්මයා,
(1) බෝසතාණන් වහන්සේට ධර්මය දේශනා කිරීමට ආරාධනා කළේ ය.
(2) බෝසතාණන් වහන්සේට කිරිපිඬු පූජා කළේ ය.
(3) බෝසතාණන් වහන්සේට මනුලොව ඉපදීමට ආරාධනා කළේ ය.
(4) බෝසතාණන් වහන්සේට විළඳ මී පිඬු පිළිගැන්වූයේ ය.

(02) මහාමායා දේවිය විසින් පුදුම උපදවන සිහිනය දකින ලද්දේ,
(1) වෙසක් පෝය දිනකය. (2) ඇසළ පෝය දිනකය.
(3) දුරුතු පෝය දිනකය. (4) පොසොන් පෝය දිනකය.

(03) සුද්ධෝදන රජතුමාගේ ගුරුවරයා වූයේ,
(1) සර්වමිත්‍ර බමුණාය. (2) කොණ්ඩඤ්ඤ බමුණාය.
(3) අසිත බමුණාය. (4) අස්සජි බමුණාය.

(04) ශික්ෂාකාමී භික්ෂූන් අතර අග තනතුරට පත් වූයේ,
(1) රාහුල මහ රහතන් වහන්සේය. (2) සැරියුත් මහ රහතන් වහන්සේය.
(3) මුගලන් මහ රහතන් වහන්සේය. (4) කාශ්‍යප මහ රහතන් වහන්සේය.

(05) සුද්ධෝදන පිය රජු තම පුතුට පළමුව වැන්දේ,
(1) අසිත තාපසතුමා වැන්ද අවසථාවේ දී
(2) වප් මඟුල් දිනයේ දී
(3) සිදුහත් කුමරු ශිල්ප දක්වන අවස්ථාවේ දී
(4) කුමරුට නම් තබන දිනයේ දී

(06) මහාමායා දේවී කළුරිය කළේ කුමරු ඉපදී දින,
(1) දහයකට පසුවය. (2) අටකට පසුවය. (3) හතකට පසුවය. (4) හයකට පසුවය.

(07) සිදුහත් තවුසාණන් දුෂ්කර ක්‍රියා කිරීම සඳහා ගත කළ කාලය වනුයේ,
(1) අවුරුදු දෙකකි. (2) අවුරුදු හතරකි. (3) අවුරුදු හයකි. (4) අවුරුදු අටකි.

(08) ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ශිල ශික්ෂාවට අයත් අංග ඇතුළත් පිළිතුර වනුයේ,
(1) සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා
(2) සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම
(3) සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව
(4) සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි



123

(09) දෙමව්පියන් 'බ්‍රහ්ම' යන නාමයෙන් හැඳින්වීමට හේතුව වනුයේ, ඔවුන්,

(1) සතර බ්‍රහ්ම විහරණ වලින් යුක්ත වන නිසාය,

(2) පන්සිල් ආරක්ෂා කරන නිසාය.

(3) දරුවන්ට නිවැරදි මග කියා දෙන නිසාය

(4) බොහෝ කරුණාවන්ත නිසාය.

(10) සංඝමිත්තා තෙරණිය ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ලංකාවට වැඩම කරවූයේ,

(1) වෙසක් පුන් පොහෝ දිනකය. (2) දුරුතු පුන් පොහෝ දිනකය.

(3) නවම් පුන් පොහෝ දිනකය. (4) උඳුවප් පුන් පොහෝ දිනකය.

(11) ලාංකීය භික්ෂුණී ශාසනයතුළ පැවිදි වූ මුල් ම කාන්තාව වනුයේ,

(1) විහාර මහා දේවියයි. (2) සුගලා දෙවියයි.

(3) සෝමා දේවියයි. (4) අනුලා දේවියි.

(12) මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිව දී දේශනා කළ ප්‍රථම සූත්‍ර දේශනාව වන්නේ,

(1) චූල්ල හත්ථි පදෝපම සූත්‍රයයි. (2) අනන්ත ලක්ඛන සූත්‍රයයි.

(3) දම්සක් පැවතුම් සූත්‍රයයි. (4) ආසිවිසෝපම සූත්‍රයයි.

(13) අපගේ ලොවේ හිරු සඳු නැතහොත් කුල දෙවියන් ලෙස සැලකෙන්නේ,

(1) පැවිදි උතුමන් ය. (2) ගුරුවරුන් ය. (3) වැඩිහිටියන් ය. (4) දෙමව්පියන් ය.

(14) පන්සිල් සුරැකීම හා සැමට මෛත්‍රිය කිරීමෙහි අගය පෙන්වා දෙන ජාතක කථාවක් වනුයේ,

(1) ස්වර්ණ හංස ජාතකය. (2) මස ජාතකය.

(3) වණ්ණුපථ ජාතකය. (4) අපණ්ණක ජාතකය.

(15) 'සියල්ලෝම දඬුවමින් තැති ගනිති. සියල්ලෝ ම ජීවිතයට ප්‍රිය වෙති. එහෙයින් තමා උපමා කොට අනුන් නොමරන්න. නොමරවන්න.' මෙම අදහස දෙන ධම්ම පද ගාථාවේ මුල් දෙපදය වනුයේ,

(1) සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේ භායන්ති මච්චුනො

(2) තංච කම්මං කතං සාදු - යං කත්වා නානුතප්පති

(3) සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේ සං ජීවිතං පියං

(4) තංච කම්මං කතං සාධූ - යං කත්වා නානුතප්පති

(16) විසි වසරකට පෙර රූ රැජින තරගයෙන් ජයගත් කමලා දැන් වියපත් වෙලා. හිස කෙස් සුදු වෙලා. ඇස් පෙනීම අඩුවෙලා. හම රැලි වැටිලා. මෙම වෙනස් වීම හඳුන්වන්නේ,

(1) අනාත්මතාව යනුවෙනි. (2) අනිත්‍යතාව යනුවෙනි.

(3) දුක්ඛතාව යනුවෙනි. (4) අප්‍රියතාව යනුවෙනි.

(17) සුගුණපාල සොරකම් නොකරයි. අන් අය ලවා සොරකම් නොකරවයි. අන් අය සොරකම් කළද එය අනුමත නොකරයි. ඔහු සම්බන්ධව වඩාත්ම ගැලපෙන පිළිතුර වන්නේ, ඔහු

(1) පංචශීලය සුරකියි.

(2) ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලය සුරකියි.

(3) අටසිල් සුරකියි.

(4) දස සිල් සුරකියි.

(18) පුද්ගලයාගේ දියුණුව සඳහා උපකාරී වන කරුණු ඇතුළත් වන ජාතක කථාව වනුයේ,

(1) වෙස්සන්තර ජාතක කථාවයි. (2) සස ජාතක කථාවයි.

(3) අත්ථස්සද්වාර ජාතක කථාවයි. (4) සාම ජාතක කථාවයි.

(19) සම්මා වාචාවලට අදාළ වන්නේ,

(1) සත්‍ය කථාවෙන් වැළකීමයි. (2) ප්‍රිය වදනින් වැළකීමයි.

(3) මුසා බසින් වැළකීමයි . (4) මිහිරි වදනින් වැළකීමයි.

(20) නියම ශ්‍රද්ධාවන්තයෙකු තුළ දක්නට ලැබෙන ලක්‍ෂණ ඇතුළත් පිළිතුර වන්නේ,

(a) දෙවියන් වඳියි. (b) දහම් අසයි. (c) දන් දීමට කැමතියි.

(1) ab නිවැරදියි. (2) bc නිවැරදියි. (3) ac නිවැරදියි. (4) සියල්ලම නිවැරදියි.

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

* පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
* පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
* පළමු ප්‍රශ්නයට ලකුණු 20 කි. අනෙක් ප්‍රශ්නවලට (2+3+5=10) ලකුණු 10 බැගිනි.

---

(01) 6 ශ්‍රේණියේ III වාරයට අදාළ පාසල් පාදක ඇගැයීම යටතේ ඔබ විසින් නිර්මාණය කරන ලද බිත්ති පුවත්පතට අදාළව පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබ බිත්ති පුවත්පත සෑදීමට උපයෝගී කරගත් අමුද්‍රව්‍ය දෙකක් නම් කරන්න.

(ii) එය සෑදීමේ දී ඔබට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න.

(iii) බිත්ති පුවත්පතට යෙදූ නම කුමක්ද?

(iv) එහි ප්‍රදර්ශනය කිරීමට ඔබ විසින් ඉදිරිපත් කළ නිර්මාණ දෙකක් නම් කරන්න.

(v) බිත්ති පුවත්පත නිර්මාණය කිරීමේ දී ඔබ කණ්ඩායම මුහුණ දුන් ගැටළු දෙකක් ලියන්න.

(vi) පරිසරයෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන දෙකක් නම් කරන්න.

(vii) බුදු දහම ලැබීමෙන් පසු අප රටට ලැබුණු අනෙකුත් දායාද දෙකක් නම් කරන්න.

(viii) ශීලයෙහි ප්‍රභේද දෙක නම් කරන්න.

(ix) 'මුසාවාදා වේරමණී සික්ඛා පදං සමාදියාමි' යන සිල් පදයෙහි අදහස ලියන්න.

(x) 'කායේන සංවරෝ සාධු - සාධු වාචාය සංවරෝ'... මෙම ගාථාවෙහි ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න. (ලකුණු 2 x 10 = 20)

(02) (i) ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය හා ජාතික පුෂ්පය නම් කරන්න.

(ii) ජාතික ගීයෙන් පැවසෙන බොදු ගුණ තුනක් සඳහන් කරන්න.

(iii) ජාතික කොඩිය පරිහරණයේ දී අප විසින් සැලකිලිමත් විය යුතු කරුණු පහක් ලියන්න.

(03) (i) සම්මා ආජීව යනු කුමක් දැයි පැහැදිලි කරන්න.

(ii) සම්මා කම්මන්තයට අයත් අංග තුන නම් කරන්න.

(iii) සිල්වත්ව කටයුතු කිරීමෙන් ලැබෙන ආනිසංස පහක් ලියන්න.

(04) (i) 'මෛත්‍රිය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ii) භාවනාවට පෙර ඔබ විසින් කරනු ලබන කාර්යයන් තුනක් ලියන්න.

(iii) මෛත්‍රී භාවනාවේ ආනිසංස පහක් සඳහන් කරන්න.

(05) (i) විහාරස්ථානයේ දී ඔබ විසින් ඉටුකරනු ලබන වතාවත් දෙකක් සඳහන් කරන්න.

(ii) ත්‍රිවිධ චෛත්‍ය නම් කරන්න.

(iii) දහම් ගුණ සිහි කරන පාඨය ලියා දක්වන්න.

(06) (i) හොඳ නරක ක්‍රියා හඳුනා ගන්නා ආකාරය විස්තර කරමින් බුදු රජාණන් වහන්සේ රාහුල හිමියන්ට දේශනා කළ සූත්‍ර දේශනාව කුමක් ද?

(ii) හොඳ ක්‍රියාවක් තෝරා ගත හැකි මිනුම් දඬු තුන ලියන්න.

(iii) බොදු දරුවෙකු ලෙස ඔබ තුළ ඇති හොඳ ගුණ පහක් ලියන්න.

(07) (i) මිහිඳු හිමියන් දේවානම්පියතිස්ස රජුගෙන් විමසූ පැන දෙක නම් කරන්න.

(ii) දේවානම් පියතිස්ස රජු ඉදි කළ විහාර ආරාම තුනක් නම් කරන්න.

(iii) මහින්දාගමනයෙන් පසු බෞද්ධ ජන ජීවිතය තුළ ඇති වූ වෙනස්කම් පිළිබඳ වාක්‍ය පහක් ලියන්න.

The National e-learning Portal for The General Education